**කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල අතර 1995 මාර්තු 27 දින හා 2001 සැප්තැම්බර් 03 දින එළඹි පිළිවෙලින් අංක 466 හා අංක 627 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල ප්‍රවාහන පිරිවැය අඩුකිරීම හා දිවයිනේ පළාත් හා අග නගරය අතර ගමන් කිරීමට ගතවන කාලය අඩු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සහාය දීම ව්‍යාපෘතියේ අරමුණු වේ. පටු හා අබලන් පාලම් 32 ක් පුනරුත්ථාපනය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ ආදේශ කිරීම මගින් මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම හා ගැටඹේ - ගන්නෝරුව මාර්ගය පුළුල් කිරීමද ව්‍යාපෘතිය ඉලක්ක කර ඇත. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 3,432 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10.12 ක් වන අතර ඉන් රු.මිලියන 1,728.2 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 5.10 ක් සැපයීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබුණි. 1995 මාර්තු 27 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 1997 දෙසැම්බර් 31 වන විට මාස 33 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. මෙම කාල පරිච්ඡේදය 2014 දෙසැම්බර් 31 දක්වා තවත් වර්ෂ 13 කින් අවස්ථා 7 කදී දීර්ඝ කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

( අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ව්‍යාපෘතියට ලැබුණු රජයේ දායකය මූල්‍ය ප්‍රකාශනවල රු.10,600,000 ක් ලෙස දැක්වෙන නමුත් මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ විසර්ජන ගිණුමේ එයට අනුරූපීව දැක්වෙන සංඛ්‍යාව රු.10,507,508 ක් විය.

**3 මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | **උපයෝජනය කළ අරමුදල්** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල | 5.10 | 1,728 | 37.50 | 0.081 | 37.44 | 3.60 | 1,623.75 |
| ශ්‍රී ලංකා රජය | - | 1,704 | 10.60 | - | 10.50 | - | 1,669.31 |
| එකතුව | 5.10 | 3,432 | 48.10 | 0.081 | 47.94 | 3.60 | 3,293.06 |

**3.2 භෞතික ප්‍රගතිය**

පාලම් 32 ක ඉදිකිරීම් වැඩ හා ගැටඹේ ගන්නෝරුව මාර්ගය පුළුල් කිරීම සමාලෝචිත වර්ෂය තුළ නිම කර තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවද 2014 දෙසැම්බර් මාසයේදී නිම කිරීම සැලසුම් කරන ලද ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ පාලම් 03 හි උපකරණ ගෙන යාමට මාස 02 කට වැඩි කාලයක් ගත කිරීම හේතුවෙන් ප්‍රමාදයන් සහිතව නිම කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

ගාල්ල - දෙණියාය - මාදම්පේ මාර්ගයේ පාලම් 3 ක් ඉදිකිරීම පිළිබඳ විෂයයන් 04 ක් යටතේ තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 52.29 සිට සියයට 162.75 කින් ඉහළ ගොස් තිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම පාලම් ඉදිකිරීමේ පිරිවැය රු.මිලියන 4.45 කින් වැඩිවී තිබුණි.